ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**STU5513- තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු**
කාලය - පැය තුනයි (03)

---

දිනය - 2024.12.17 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. 1932 දී හඳුන්වා දුන් "හන්දෙස්ස ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය" කෙටියෙන් විස්තර කරන්න.

02. ස්කොලාකල් කොමිසමේ කාර්යයන් දෙකක් (02) සඳහන් කරන්න.

03. රටක 'භාෂා ප්‍රතිපත්තියක්' පිහිටුවීමේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

04. ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ව්‍යුහයේ පැවති විෂයමාලාව යහපත් පුරවැසියෙකු තැනීමට උපකාරිවූයේ කෙසේද? සුදුසු උදාහරණ දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න.

05. 1939 දී පිහිටුවන ලද මධ්‍ය මහා විද්‍යාල ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ දියුණුවට බලපෑවේ කෙසේද? කෙටියෙන් විස්තර කරන්න.

06. 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරි කණ්ඩායම් මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට සිදුවූ බලපෑම කරුණු දෙකක් (02) ඇසුරින් සඳහන් කරන්න.

07. සැමට "සම අධ්‍යාපනයක්" ලබා දීමට ශ්‍රී ලංකාවේ රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් (04) සඳහන් කරන්න.

08. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ආගමික කණ්ඩායම් වල පාසල් පවත්වාගෙන යාම නතර කල යුතු බවට හේතුවූ සාධක හතරක් (04) සඳහන් කරන්න.

(ලකුණු 5x8=40)

## දෙවන කොටස

09. (i) තුලනාත්මක අධ්‍යාපනය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) තුලනාත්ම අධ්‍යාපන සංකල්පය තුල "තුලනාත්මක හා ජාත්‍යන්තර අංශය" ලෙස අංශ දෙකකි. (ස්ටෝන්, 2005) මෙම අංශ දෙක (02) මගින් කුමක් අදහස් කරයිද? යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) තුලනාත්මක අධ්‍යාපනය පිළිබඳ දැනුම නාට්‍ය හා රංගකලා හෝ විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස ඔබට වැදගත් වන ආකාරය උදාහරණ දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i.) **"ගෝලීයකරණය"** යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

(ii.) අධ්‍යාපනයේ ජාත්‍යන්තරිකරණය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම කෙසේද? කරුණු දෙකක් **(02)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

(iii.) ගෝලීයකරණය හේතුවෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ඇති කරන ලද ධනාත්මක හා ඍණාත්මක බලපෑම් දෙක **(02)** බැගින් විස්තර කරන්න. (ලකුණු 08)

11. (i.) බ්‍රිතාන්‍ය පාලන සමයේදී, 1867 මෝර්ගන් කමිටු වාර්තාව විසින් සිදුකරන ලද නිර්දේශ පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) මෝර්ගන් කමිටුවේ නිර්දේශ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකනු ලබන්නේ ඇයිදැයි කරුණු තුනක් **(03)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 07)

(iii.) "1829 දී කෝල්බෲක් කොමිසමේ නිර්දේශ වලට සාපේක්ෂව 1865 දී මෝර්ගන් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ වඩාත් ප්‍රගතිශීලි ස්වරූපයක් ගනී."

මෙම කියමනට ඔබ එකඟද? එසේ නම් ඒ ඇයි ද යන්න කරුණු දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i.) ඇමරිකා එක්සත් ජනපදය සංවර්ධිත රටක් ලෙසත්, ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙසත් සලකන්නේ ඇයි? හේතු දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) සංවර්ධිත රටවල අධ්‍යාපනයේ දැකිය හැකි නව ප්‍රවණතා හතරක් **(04)** දක්වා ඉන් දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii.) ඉහත සඳහන් කරන ලද නව ප්‍රවණතා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සංවර්ධනයට යොදා ගත හැක්කේ කෙසේද? කරුණු දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

13. (i.) "බහු වාර්ගික" සමාජයක් යන්න ඔබ නිර්වචනය කරන්නේ කෙසේද?

(ලකුණු 06)

(ii.) විවිධ ජනවාර්ගික ප්‍රජාවන් අතර අවබෝධය සහ සහයෝගීතාවය වර්ධනය කිරීමේදී අධ්‍යාපනය විසින් ඉටුකරන කාර්යභාරය කරුණු දෙකක් **(02)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ඔබේ සිසුන් අතර, සංස්කෘතික අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට භාවිතා කළ හැකි උපායමාර්ග මොනවාද? උදාහරණ දෙකක් **(02)** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

-හිමිකම් ඇවිරිණි.-